


අභිරහස් කාමරයේ
සැඟවුනු රහස
H.M. ඩිලක්ෂි ඔමන්ෂා හේරත්

# අභිරහස් කාමරයේ සැගවුනු අබිරහස


## H.M. ඩිලක්ෂි ඔමන්ෂා හේරත්

කතෘ

මහ/මහමායා බාලිකා විදුහල

6 - C


2026.06.15

ISBN: 978-624-211-481-1

# පිදුම

## මගේ පවුලේ සැම දෙනාටත්

## මාගේ නිර්මාණයේ වැරදි අඩුපාඩු පෙන්වා දුන්

## සිංහල විෂය උගන්වන

## ගුරු මැණියන්ටත්

## මා දිරිමත් කල සියලු දෙනාටත් මෙම පොත පුදමි!



## පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා  සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,

ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.

සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමී.


ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

# *අභිරහස් කාමරයේ සැඟවුණු රහස*
# *(අද්භූත බෝනික්කා)*

එකමත් එක ගමක ඔලිවියා කියලා පුංචි, හුරුබුහුටි ගැහැණු ළමයෙක් ජීවත් වුණා. ඇගේ පුංචි පවුලේ සිටියේ ඇයත්, ඇගේ අම්මා සහ තාත්තාත් විතරයි. ඔලිවියා මුලින්ම ගියේ ගමේ තිබුණු පාසලට. ඇය ඉගෙනීමට ඉතාමත් දක්ෂ, කීකරු ළමයෙක් වූ නිසා, ඇගේ ගුරුවරු දෙමව්පියන්ට උපදෙස් දුන්නේ ඔලිවියාව නගරයේ තිබෙන උසස් බාලිකා විද්‍යාලයකට ඇතුළත් කරන ලෙසයි.

දෙමව්පියන් ද ඇයගේ අනාගතය වෙනුවෙන් ඒ පිළිබඳ සොයා බලා, ඔලිවියාව උසස් බාලිකා විද්‍යාලයට ඇතුළත් කළා. ඒ සඳහා ඔවුන්ට අලුත් ගමකට පදිංචියට යාමට සිදු වුණා. නමුත් ඒ දිනවල ඔලිවියාගේ තාත්තා දැඩි ආර්ථික අපහසුතාවලින් පීඩා විඳිමින් සිටි නිසා, ඔවුන්ට සිදු වුණේ ඉතා අඩු මුදලකට, හුදෙකලා පරිසරයක තිබූ පැරණි නිවසක් මිලදී ගැනීමටයි.

අලුත් නිවසට මුලින්ම පැමිණියේ ඔලිවියා සහ ඇගේ අම්මායි. නිවස අවට තිබූ බඩු බාහිරාදිය අස්පස් කරන අතරතුර, ඔලිවියාට නිවස අසල තිබූ පැරණි බෝනික්කන් විකුණන විශාල කඩයක් දැකගන්නට ලැබුණා. එහි තිබූ එක් අමුතු බෝනික්කෙකුට ඔලිවියාගේ සිත ඇදී ගිය නිසා, ඇය අම්මා ලවා එම බෝනික්කාව මිලදී ගත්තාය.



ඔලිවියා අලුත් බෝනික්කා ද රැගෙන මහත් සතුටින් නිවසට පැමිණ සෙල්ලම් කිරීමට පටන් ගත් අතර, අම්මා රාත්‍රී ආහාරය පිසීමට මුළුතැන්ගෙයට ගියාය. මඳ වේලාවකින් තාත්තා ද නිවසට පැමිණි අතර, අම්මා සහ තාත්තා දෙදෙනාම ඔලිවියාට කතා කළේ රාත්‍රී ආහාරය ගැනීම සඳහා නිවස තුළට පැමිණෙන ලෙසයි.

ආහාර ගැනීමෙන් පසු, සියලු දෙනාම තමන්ගේ දෛනික වැඩකටයුතුවල නිරත වන්නට වූහ. අම්මා නිවස පිරිසිදු කිරීමටත්, තාත්තා තමන්ගේ ව්‍යාපාරික කටයුතුවලටත් ලැස්ති වෙද්දී, ඔලිවියා නැවතත් බෝනික්කා සමඟ සෙල්ලම් කිරීමට මිදුලේ තිබූ ඔංචිල්ලාව වෙත පිය නැගුවාය.

නමුත්, ඇය යන විට ඔංචිල්ලාව මත බෝනික්කා සිටියේ නැත! ඔලිවියා මුළු එළිමහන පුරාම සෙව්වත් බෝනික්කාව සොයාගත නොහැකි වූ බැවින් ඇය දැඩි ශෝකයකින් සහ බියකින් ඔංචිල්ලාව මත වාඩි වී හඬන්නට වූවාය.



දුව හඬන අයුරු දුටු අම්මා, ඒ පිළිබඳව විමසූ විට ඔලිවියා පැවසුවේ තමා කෑම කන්නට යන විට ඔංචිල්ලාව මත තබා ගිය බෝනික්කා අතුරුදන් වී ඇති බවයි. අම්මා ඇයව සනසා, කාමරයට ගොස් පාඩම් වැඩ කටයුතු කරන ලෙස අවවාද කළාය. ඔලිවියා දුකෙන් හා බියෙන් තමාගේ කාමරයට යන විට ඇයට දැකගන්නට ලැබුණේ අදහාගත නොහැකි දසුනකි. අතුරුදන් වූ බෝනික්කා ඇගේ ඇඳ උඩ වාඩි වී සිටියේය

මහත් සේ බියට පත් වූ ඔලිවියා මරහඬ දී කෑගසන්නට වූවාය. දුවගේ කෑගැසීම ඇසුණු අම්මා වහාම කාමරයට දිව ආවාය. එවිට වේලාව සන්ධ්‍යා භාගයේ 6.45 ට පමණ ඇත. බියෙන් ගැහෙමින් හඬන ඔලිවියාව අම්මා විසින් තාත්තා සිටි ප්‍රධාන නිදන කාමරය වෙත රැගෙන යන ලදී.

පසුදා උදෑසන ද බෝනික්කා එතැනම සිටි නමුත්, ඔලිවියා සිටියේ ඌ දෙස බැලීමට පවා දැඩි බියකිනි. ඇය පාසල් යාමට සූදානම් වී, මුළුතැන්ගෙයි සිටි අම්මා වෙත ගොස්, "අම්මේ, මේ බෝනික්කා දිහා පොඩ්ඩක් බලාගන්න" යැයි පවසා බියෙන් පසුවුවද පාසල් බලා පිටත් වූවාය. අම්මා ද ආහාර පිසින අතරතුර වරින් වර මේ අද්භූත බෝනික්කා දෙස බලා සිටියාය.

එක්වරම, බෝනික්කා තමා දෙස බලා අද්භූත ලෙස සිනාසෙන අයුරු දැක අම්මා දැඩි සේ බියට පත් වූවාය. සවස තාත්තා නිවසට පැමිණි පසු, අම්මා සිදුවූ සියල්ල ඔහුට පැවසුවාය. තාත්තා ද දැඩි බියට පත් වූ අතර, ඔවුන් දෙදෙනාම එකතු වී ඔලිවියා පාසලේ සිට නිවසට පැමිණීමට පෙර, මෙම බෝනික්කාව නිවසේ කෙළවරක තිබූ අඳුරු, රහස් කාමරයක දමා දොර වසා දැමූහ. නමුත් ඔවුන් දැන සිටියේ නැත, මීට වසර කිහිපයකට පෙර එම නිවසේ විසූ කුඩා දැරියක් අභිරහස් ලෙස සියදිවි හානිකරගෙන ඇත්තේ ද ඔන්න ඔය කියන අඳුරු කාමරය තුළදීම බව!

ඔලිවියා පාසල් හැර නිවසට පැමිණි විට නැවතත් බෝනික්කා නොසිටි නිසා ඇය බෝනික්කා සෙවීමට පටන් ගත්තාය. නිවසේ කොරිඩෝව කෙළවරට යන විට ඇයට මීට පෙර අවධානයට ලක් නොවූ, දූවිලි හා මකුළු දැල්වලින් පිරුණු අමුතු කළු පැහැති දොරක් දැකගත හැකි විය. ඔලිවියා ඒ දෙසට පිය නගද්දීම එතැනට පැමිණි අම්මා, ඇයව වහාම දිවා ආහාරය සඳහා මුළුතැන්ගෙයට කැඳවාගෙන ගියාය.

නමුත් ඒ අඳුරු කාමරය තුළ, මියගිය දැරියගේ පැරණි සිතුවමක් එල්ලා තිබුණි. ඇය ජීවත්ව සිටි කාලයේ ඇගේ පණ මෙන් ආදරය කළ බෝනික්කා, මේ ඔලිවියා මිලදී ගත් බෝනික්කාම විය! දැරියගේ මරණින් පසු ඇගේ නොසන්සුන් ආත්මය වැසී තිබුණේ මේ බෝනික්කා තුළයි. එම ආත්මයේ අරමුණ වූයේ මේ අලුත් පවුල නිවසින් පන්නා දැමීම හෝ ඔවුන්ගෙන් පළිගැනීමයි.

තෙවන දිනයේ ඔලිවියා දැඩි ලෙස අසනීප වී සිටි නිසා පාසල් ගියේ නැත. උදෑසන 8.30 ට පමණ අවදි වූ ඇය, තාත්තා ව්‍යාපාරික කටයුතුවලට පිටත්ව යන තුරුත්, අම්මා මුළුතැන්ගෙයි වැඩවලට කාර්යබහුල වන තුරුත් බලා සිටියාය. අම්මාගේ ඇස් වසා, ඔලිවියා අර කලින් දුටු අද්භූත කළු දොර අසලට ගියාය. මෙවර දොර වසා තිබුණේ නැත. ඇය මහත් බියෙන් හා කුතුහලයෙන් යුතුව කාමරය තුළට ඇතුළු වූවාය.

කාමරය පුරා බෝනික්කා සොයන විට, පැරණි පෙට්ටියක් මත බෝනික්කා වාඩි වී සිටිනු ඇයට පෙනුණි. නමුත්, මෙවර බෝනික්කාගේ අතේ තියුණු පිහියක් තිබුණි! බෝනික්කා තමා දෙසට පැමිණෙනු දැක ඔලිවියා මරහඬ දී කෑගැසුවද, මුළුතැන්ගෙයි සිටි අම්මාට ඒ හඬ ඇසුණේ

නැත. ඔලිවියා බෝනික්කාගෙන් බේරීමට දැඩි ලෙස උත්සාහ කළද, ඇගේ සියලු උත්සාහයන් අසාර්ථක විය.

මද වේලාවකින් ආහාර පිස අවසන් කළ අම්මා ඔලිවියාට කෑමට කතා කළාය. දුවගෙන් ප්‍රතිචාරයක් නැති තැන, අම්මා නිවස පුරා ඇයව සෙවූ නමුත් සොයාගත නොහැකි විය. කලබල වූ අම්මා වහාම තාත්තාට දුරකථන ඇමතුමක් දී සියල්ල පැවසූ අතර, තාත්තා ද වහාම නිවසට පැමිණියේය.



දෙදෙනාම එකතු වී සොයද්දී ඔවුන්ට අර අත්හැර දමා තිබූ කළු කාමරයේ දොර මඳක් විවෘත වී ඇති බව පෙනුණි. ඔවුන් දොර හැර ඇතුළට යන විට දුටු දසුනින් අම්මා සිහිසුන්ව බිම ඇද වැටුණාය. තාත්තා වහා ඇයට වතුර ඉස, පුටුවකින් වාඩි කරවා, වහාම ප්‍රදේශයේ වෛද්‍යවරයකු කැඳවාගෙන ආවේය. වෛද්‍යවරයා ඔලිවියාව පරීක්ෂා කර බලා, ඇය ඒ වන විටත් මියගොස් ඇති බව අවාසනාවන්ත ලෙස දන්වා සිටියේය.

ලෝකයම තනි වූ දෙමව්පියන් දැඩි කෝපයෙන් හා ශෝකයෙන් යුතුව බෝනික්කාව එම කාමරය තුළටම දමා දොර අගුළු ලෑහ. ඉන්පසු ඔවුන් ප්‍රදේශයේ සිටි බලගතු තාපසතුමෙකු හමු වී මේ විපත්තිය පිළිබඳව සැළ කර සිටියහ. නිවසට පැමිණි තාපසතුමා, තම මන්ත්‍ර බලයෙන් බෝනික්කා තුළ සිටි අද්භූත ආත්මය කැඳවා ප්‍රශ්න කළේය. මුලදී සත්‍යය වසන් කළද, තාපසතුමාගේ බලය හමුවේ ආත්මයට සත්‍යය ප්‍රකාශ කිරීමට සිදු විය.

ඔලිවියාව තමා වෙත ඇදගත් බව පිළිගත් එම ආත්මය, ඔලිවියාගේ දෙමව්පියන්ගේ දුක දැක, ඔවුන්ට ඇයව සැමදා දැකබලා ගැනීමට හැකි වන පරිදි කුඩා ඉඩක් ලබා දීමට එකඟ විය. ඒ අනුව, ඔලිවියාගේ දේහය භූමිදානය කළ මාර්ගය අසලින් යන සැම විටම දෙමව්පියන්ට ඇයගේ රුව පෙනෙන්නට සලස්වන ලදී.

අවසානයේ, ඔලිවියාගේ ආත්මය මෙන්ම බෝනික්කා තුළ සිරවී සිටි අනෙක් දැරියගේ ආත්මය ද සනසා නිදහස් කිරීමට තාපසතුමා සමත් විය. ඉන්පසු, ඒ අද්භූත බෝනික්කාගේ ශාපය සදහටම අවසන් වූ අතර, මියගිය දුවගේ මතකයන් සමඟ දෙමව්පියන් නැවතත් සාමකාමීව ජීවත් වන්නට වූහ



# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්

( ව්‍යාපෘති නිර්මාතෘ)